2021 වර්ෂය සඳහා වාර්ෂික කාර්ය සාධන වාර්තාව

විසිතුරු මසුන් මිරිදිය මත්ස්‍ය හා ඉස්සන් ඇති කිරීම,ධීවර වරාය සංවර්ධන, බහුදින ධීවර කටයුතු හා මත්ස්‍ය අපනයන රාජ්‍ය අමාත්‍යාංශය

මාළිගාවත්ත, කොළඹ -10

වැය ශීර්ෂ අංකය : 405

අන්තර්ගතය	පිටු අංකය
01. ආයතනික පැතිකඩ	
1.1.හැඳින්වීම	03
1.2.ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු	04
1.3.ප්‍රධාන කාර්යයන්	05
1.4.සංවිධාන සටහන	06
1.5.අමාත්‍යාංශය යටත් පවතින දෙපාර්තමේන්තු	07
1.6.අමාත්‍යාංශය යටතේ පවතින ආයතනගත අරමුදල්	08
1.7.විදේශ අධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු	09
02.ප්‍රගතිය හා ඉදිරි දැක්ම	10-13
03.2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය	
3.1. මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය	14 - 15
3.2. මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය	16
3.3. මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය	17 - 18
3.4. මූල්‍ය ප්‍රකාශ සටහන්	19
3.5. ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය	20
3.6. වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය	20
3.7. මු.රෙ.208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු වල නියෝජිතයකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන	20
3.8. මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය	21
3.9. විගණකාධිපතිවරයාගේ වාර්තාව	22
04.කාර්ය සාධන දර්ශක	
4.1. ආයතනයේ කාර්ය සාධන දර්ශක(ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)	23
05.තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය	
5.1. හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු	24
5.2. තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග සැකෙවින්	24 - 28
06.මානව සම්පත් පැතිකඩ	
6.1. සේවක සංඛ්‍යා කළමනාකරණය	29
6.2. ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපා ඇති ආකාර්ය	29
6.3. මානව සම්පත් සංවර්ධනය	29
07.අනුකූලතා වාර්තාව	30 - 36

01 ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1. හැඳින්වීම

ප්‍රධාන වශයෙන් මත්ස්‍ය සම්පතින් ගහන වර්ග කි.මී. 517,000 ක සාගර සම්පතින් හා සංවර්ධනය කල හැකි කලපු, මෝය හා වැව් වලින් යුත් හෙක්ටයාර් 489,000 ක ජලාශ පද්ධතියකින් සමන්විත ශ්‍රී ලංකාවේ ධීවර අංශය, එහි මානව සම්පත අතීතයේ සිට ධීවර හා ජලජ සම්පත් නෙලා ගැනීම ජීවනෝපාය කරගත් ධීවර ප්‍රජාව හා ඒ හා සම්බන්ධ වක්‍ර සේවා නියුක්තිකයන්ගෙන් යුක්තවේ. මානව සම්පත් හා ස්වාභාවික සම්පත් වලින් අනූන ශ්‍රී ලංකාවේ ධීවර කර්මාන්තය ඉහළ තලයකට රැගෙන ඒම පිණිස රජය විසින් විශාල පිරිවැයක් දරා යටිතල පහසුකම් රැසක් ඉදිකර තිබීම වැදගත් කොට සැලකිය යුතුය.

ශ්‍රී ලංකාවේ ධීවර අංශය හා සම්බන්ධ රාජ්‍ය අමාත්‍යාංශය වන්නේ විසිතුරු මසුන්, මිරිදිය මත්ස්‍ය හා ඉස්සන් ඇති කිරීම,ධීවර වරාය සංවර්ධන, බහුදින ධීවර කටයුතු හා මත්ස්‍ය අපනයන රාජ්‍ය අමාත්‍යාංශයයි. ස්වයංපෝෂිත ධීවර ආර්ථිකයක් ඇති කිරීම සඳහා අදාළ නීති හා අණ පනත් වලට අනුකූලව විසිතුරු මසුන්, මිරිදිය මත්ස්‍ය හා ඉස්සන් ඇති කිරීම, බහුදින ධීවර හා මත්ස්‍ය අපනයන විෂයට අදාළව ප්‍රතිපත්ති සම්පාදනයට සහාය වීම, ජාතික අයවැය රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩ පිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට මෙම අමාත්‍යාංශය සෘජුවම සම්බන්ධ වේ.

ධීවර කර්මාන්තය අලුතින් ක්‍රියාත්මක කළ ව්‍යාපෘති හා වැඩසටහන් නිසා යෝධ පිම්මකින් ඉදිරියට ගොස් ඇති අතර එබඳු දැ ක්‍රියාත්මක කිරීම තුළින් ජාතික ප්‍රතිපත්තිමය අරමුණු සාක්ෂාත් කර ගැනීමට හැකි වනු ඇතැයි පුරෝකථනය කරනු ලැබේ.

විසිතුරු මසුන් මිරිදිය මත්ස්‍ය හා ඉස්සන් ඇති කිරීම,ධීවර වරාය සංවර්ධන, බහුදින ධීවර කටයුතු හා මත්ස්‍ය අපනයන රාජ්‍ය අමාත්‍යාංශයේ විෂය පථය යටතේ ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනය, ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය, ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව, ලංකා ධීවර සංස්ථාව හා සී/ස සීනෝර් පදනම යන ආයතන ක්‍රියාත්මක වන අතර එම ආයතන වල සහයෝගය තුලින් අපේක්ෂිත ඉහළ සංවර්ධන මට්ටමක් කරා ලඟා වීමට ඉවහල් වන ශක්තීන් හා අවකාශයන් හඳුනාගනිමින් ඒ මත සැලසුම් හා ක්‍රමෝපායන් සම්පාදනය කොට ඇත. ඒ අනුව රාජ්‍ය අමාත්‍යාංශය විසින් සුවිශේෂී ප්‍රමුඛතාවන්ට ප්‍රමුඛත්වය ලබා දෙමින් 2020 - 2025 මධ්‍යකාලීන සැලසුම්වල දක්වා ඇති අපේක්ෂිත ඉලක්ක සාධනය සඳහා ඉහත ආයතන හා එක්ව මානව හා භෞතික සම්පත් මෙහෙයවීමට කටයුතු කරන ලදී.

1.2. ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

දැක්ම

ස්වයංපෝෂිත ධීවර ආර්ථිකයක් ඇති කිරීම

මෙහෙවර

නවීන හා තිරසාර තාක්ෂණය හඳුන්වා දීම හා ආයෝජන ප්‍රවර්ධනය තුළින් ගෘහස්ථ මෙන්ම අපනයන වෙළඳපොල සඳහා වූ ධීවර හා ජලජීවී වගා ක්ෂේත්‍රයේ නිමවුම හා ඵලදායිත්වය පුලුල් කිරීම

අරමුණු

1. ජාතික මත්ස්‍ය නිෂ්පාදනය වැඩි කිරීමෙන් ජනතාවගේ පෝෂණ තත්ත්වය සහ ආහාර සුරක්ෂිතතාවය ඉහළ නංවාලීම.
2. ධීවර හා ජලජ සම්පත් කළමණාකරණය.
3. පසු අස්වනු නාස්තිය අවම කිරීම සහ මත්ස්‍ය සැපයුමේ ගුණාත්මකභාවය සම්මත ප්‍රමිතීන් කරා ඉහළ නංවාලීම.
4. ධීවර කර්මාන්තය හා ආශ්‍රිත කර්මාන්ත මඟින් රැකියා උත්පාදනය වැඩි කිරීම.
5. මත්ස්‍ය නිෂ්පාදන අපනයනයෙන් විදේශ විනිමය ඉපයීම නංවාලීම.

සුවිශේෂී ප්‍රමුඛතා

මෙම රාජ්‍ය අමාත්‍යාංශයේ සුවිශේෂී ප්‍රමුඛතා මෙසේය.

1. අපනයන වෙළඳපොළ ඉලක්ක කරගත් විසිතුරු මත්ස්‍ය කර්මාන්ත ඇති කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම.
2 වැව්,කලපු හා ගොඩ ඉඩම් ආශ්‍රිතව මිරිදිය මත්ස්‍ය වගාව ප්‍රචලිත කිරීම සඳහා අවශ්‍ය ක්‍රමෝපායන් සැකසීම.
3 මහා පරිමාණ බෝට්ටු වල මෙහෙයුම් කටයුතු කාර්යක්ෂමව සිදු කිරීම සඳහා ධීවර වරාය සංවර්ධනය කිරීම.
4 බහු දින ධීවර යාත්‍රා සඳහා මුහුදු ජලය භාවිතා කර ශීතකරණ පද්ධති සංවර්ධනය කිරීම සහ සූර්ය බලශක්තිය භාවිතය දිරිමත් කිරීම.
5 නවීන සන්නිවේදන පහසුකම්, ශීතකරණ , ඉන්ධන සැපයුම සහ සනීපාරක්ෂක පහසුකම් , නැංගුරම් ස්ථාන ,නැංගුරම් ස්ථාන වැඩිදියුණු කිරීම සහිතව සියළුම වරායන් වැඩිදියුණු කිරීම.
6 මුහුදු හා මිරිදිය මත්ස්‍යයන් පුළුල් ලෙස බෝ කිරීම සඳහා ධීවර ප්‍රජා සංගම් හා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය සමඟ ඒකාබද්ධව වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම.
7 පරිසර හිතකාමී නවීන අධි තාක්ෂණික ක්‍රම යොදා ගනිමින් මත්ස්‍ය අස්වැන්න ඉහළ නැංවීම සඳහා කටයුතු කිරීම.
8. ධීවරයන්ගේ හා එම කර්මාන්තයේ නියැලෙන්නන්ගේ වෘත්තීමය පුහුණුව හා දැනුම දියුණු කිරීම.


1.3. ප්‍රධාන කාර්යයන්

විසිතුරු මසුන් මිරිදිය මත්ස්‍ය හා ඉස්සන් ඇති කිරීම,ධීවර වරාය සංවර්ධන, බහුදින ධීවර කටයුතු හා මත්ස්‍ය අපනයන රාජ්‍ය අමාත්‍යාංශය	
ප්‍රධාන වගකීම් ක්ෂේත්‍රය	දේශීය වශයෙන් මත්ස්‍ය පරිභෝජන අවශ්‍යතා සපුරාලමින් , දේශීය හා විදේශීය වෙළෙඳපොළ ඉලක්ක කරගත් ශක්තිමත් ව්‍යාපාරික ප්‍රජාවක් බිහිකරලමින් ධීවර ප්‍රජාවගේ සමාජ හා ජීවන මට්ටම ඉහළ නංවමින් ජාතික ආර්ථිකයට ඉහළ දායකත්වයක් දක්වන ධීවර කර්මාන්තයක් ඇති කිරීම.
විසිතුරු මසුන් මිරිදිය මත්ස්‍ය හා ඉස්සන් ඇති කිරීම,ධීවර වරාය සංවර්ධන, බහුදින ධීවර කටයුතු හා මත්ස්‍ය අපනයන රාජ්‍ය අමාත්‍යාංශයේ කාර්යයන් හා කර්තව්‍යයන්	ධීවර අමාත්‍යවරයාගේ උපදෙස් හා මඟ පෙන්වීම් මත "ස්වයංපෝෂිත ධීවර ආර්ථිකයක්" ඇති කිරීම සඳහා අදාළ නීති සහ අණපනත්වලට අනුකූලව විසිතුරු මසුන් මිරිදිය මත්ස්‍ය හා ඉස්සන් ඇති කිරීම,ධීවර වරාය සංවර්ධන, බහුදින ධීවර කටයුතු හා මත්ස්‍ය අපනයන විෂයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනයට සහාය වීම,ජාතික අයවැය,රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ මීට අදාල දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයන් හා කාර්යයන් හා ඊට අදාළ ප්‍රතිපත්ති,වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසුවිපරම් කිරීම හා ඇගයීම.
විසිතුරු මසුන් මිරිදිය මත්ස්‍ය හා ඉස්සන් ඇති කිරීම,ධීවර වරාය සංවර්ධන, බහුදින ධීවර කටයුතු හා මත්ස්‍ය අපනයන රාජ්‍ය අමාත්‍යාංශයට අදාල සුවිශේෂී ප්‍රමුඛතා	1. අපනයන වෙළෙඳපොළ ඉලක්ක කරගත් විසිතුරු මත්ස්‍ය කර්මාන්ත ඇති කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම. 2. වැව්,කලපු හා ගොඩ ඉඩම් ආශ්‍රිතව මිරිදිය මත්ස්‍ය වගාව ප්‍රචලිත කිරීම සඳහා අවශ්‍ය ක්‍රමෝපායන් සැකසීම. 3. මහා පරිමාණ බෝට්ටු වල මෙහෙයුම් කටයුතු කාර්යක්ෂමව සිදු කිරීම සඳහා ධීවර වරාය සංවර්ධනය කිරීම. 4. බහුදින ධීවර යාත්‍රා සඳහා මුහුදු ජලය භාවිතා කර ශීතකරණ පද්ධති සංවර්ධනය කිරීම සහ සූර්ය බලශක්තිය භාවිතය දිරිමත් කිරීම. 5. නවීන සන්නිවේදන පහසුකම්,ශීතකරණ,ඉන්ධන සැපයුම සහ සනීපාරක්ෂක පහසුකම් සහිතව සියලුම ධීවර වරායන් ,නැංගුරම් ස්ථාන වැඩුදියුණු කිරීම. 6. මුහුදු හා මිරිදිය මත්ස්‍යයන් පුළුල් ලෙස බෝ කිරීම සඳහා ධීවර ප්‍රජා සංගම් හා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය සමඟ ඒකාබද්ධ වැඩසටහන් ආරම්භ කිරීම. 7. පරිසර හිතකාමී නවීන අධි තාක්ෂණික ක්‍රම යොදා ගනිමින් මත්ස්‍ය අස්වැන්න ඉහළ නැංවීම සඳහා කටයුතු කිරීම. 8. ධීවරයින්ගේ සහ එම කර්මාන්තයේ නියැලෙන්නන්ගේ වෘත්තීයමය පුහුණුව හා දැනුම දියුණු කිරීම.

1.4. සංවිධාන සටහන

State Ministry of Ornamental Fish, Inland Fish & Prawn Farming, Fishery Harbour Development, Multiday Fishing Activities and Fish Exports - 2022

Organizational Structure **Gazette No: 27/2187** **Date: 2020.08.09**



1.5 අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු/ආයතන

ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනය (NARA)	**අපේක්ෂිත අරමුණු** - ජලජ සම්පත් පිළිබඳ පර්යේෂණ, ජලජ සම්පත් සංවර්ධනය, සංරක්ෂණය හා කළමනාකරණය. **වගකීම්** - 1981 අංක 54 දරණ ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතන පනත යටතේ ස්ථාපිත මෙම ආයතනය මගින් ජලජ සම්පත් හා ජලජීවී වගාව, ධීවර තාක්ෂණය, මත්ස්‍ය හා පසු අස්වනු තාක්ෂණය, පාරිසරික අධ්‍යයනය, සමුද්‍ර ජීව විද්‍යාව,ජල ශාස්ත්‍රය හා සාගර අධ්‍යයන කටයුතු සිදුකිරීම.
ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය (NAQDA)	**අපේක්ෂිත අරමුණු** - වගා කිරීම මත පදනම් වූ මිරිදිය ධීවර කර්මාන්තය හා ජලජීවී වගාව සංවර්ධනය සහ කළමනාකරණය. **වගකීම්** - 1998 අංක 53 දරණ ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරී පනත යටතේ ස්ථාපිත කරන ලද මෙම ආයතනය මඟින් මිරිදිය ධීවර කර්මාන්තය සහ ජලජීවී වගාව නියාමනය,ප්‍රවර්ධනය හා සංවර්ධනය කිරීම.
ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව (CFHC)	**අපේක්ෂිත අරමුණු - ධීවර වරායන්, නැංගුරම්පොළවල් සැලසුම් කිරීම, ඉදිකිරීම හා පවත්වාගෙන යාම.** **වගකීම්** - 1957 අංක 49 දරණ රාජ්‍ය කාර්මික සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ මෙම ආයතනය මගින් වර්තමානයේ ධීවර වරායන් 20 ක් හා නැංගුරම් පොළවල් 58 ක් පවත්වාගෙන යාම.
ලංකා ධීවර සංස්ථාව (CFC)	**අපේක්ෂිත අරමුණු - මත්ස්‍ය නිෂ්පාදකයාට හා පාරිභෝගිකයාට උපරිම වාසි සැලසෙන අයුරින් මත්ස්‍ය වෙළඳපල සඳහා දායක වීම.** **වගකීම්** - 1957 අංක 49 දරණ රාජ්‍ය කාර්මික සංස්ථා පනත යටතේ ස්ථාපිත මෙම ආයතනය මගින් මාළු මිලදී ගැනීම හා විකිණීම, අයිස් නිපදවීම හා විකිණීම, ශීතාගාර පහසුකම් පවත්වාගෙන යාම හා මත්ස්‍ය අතුරු නිෂ්පාදන විකිණීම සිදුකෙරේ.
සීමාසහිත සීනෝර් පදනම	**අපේක්ෂිත අරමුණු - ධීවර කර්මාන්තයට අදාල වන්නාවූ යෙදවුම් හා සැපයුම් ලබාදීම.** **වගකීම්** - 2007 අංක 07 දරණ සමාගම් පනත යටතේ ලියාපදිංචි කර ඇති මෙම ආයතනය මගින් ෆයිබර් ග්ලාස් ආශ්‍රිත උපකරණ හා ඔරු,බෝට්ටු නිෂ්පාදනය කරන අතර අනිකුත් සියළුම ධීවර ආම්පන්න අලෙවිය සිදු කරනු ලබයි.

1.6. අමාත්‍යාංශය යටතේ පවතින ආයතන අරමුදල්

ආයතනය	වැඩසටහන	අයවැය ප්‍රතිපාදන රු.මිලියන
මෙහෙයුම් ක්‍රියාකාරකම්		
	405-01-01රාජ්‍ය අමාත්‍ය කාර්යාලය	8.25
	405-01-02 ආයතන හා පරිපාලන සේවා	4.00
		12.25
විසිතුරු මසුන් මිරිදිය මත්ස්‍ය හා ඉස්සන් ඇති කිරීම,ධීවර වරාය සංවර්ධන, බහුදින ධීවර කටයුතු හා මත්ස්‍ය අපනයන රාජ්‍ය අමාත්‍යාංශය	405-2-03-052-2506 මත්ස්‍ය අභිජනන ධාරිතාවය ඉහළ නැංවීම.	550.00
	405-2-03-061-2506 ජලජීවී වගා මධ්‍යස්ථාන නඩත්තු කිරීම,පුනරුත්ථාපනය කිරීම හා වැඩිදියුණු කිරීම. (NAQDA)	372.00
	405-2-03-068-2506 මයිලිඩි වරාය ධීවර වරායක් බවට සංවර් ධනය කිරීම සහ ශීතාගාර හා ගබඩා පහසුකම් ස්ථාපිත කිරීම.	67.00
	405-2-03-069-2506 විසිතුරු මත්ස්‍ය නිෂ්පාදනය. (NAQDA)	250.50
	405-2-03-070-2506 හම්බන්තොට ධීවර වරාය සංවර්ධනය කිරීම	20.00
	405-2-03-071-2506 සුදුවැල්ල ධීවර වරාය සංවර්ධනය කිරීම	73.00
	405-2-03-072-2506 දොඩන්දූව ධීවර වරාය සංවර්ධනය කිරීම	100.00
	405-2-03-073-2506 තොටුපොළ ස්ථාන සංවර් ධනය කිරීම.	18.00
	405-2-03-074-2506 මත්ස්‍ය අභිජනනාගාර වැඩිදියුණු කිරීම හා නව ඉදිකිරීම් (NAQDA)	300.00
	405-2-03-075-2506 මඩකලපුව, යාපනය, පුත්තලම සහ මන්නාරම දිස්ත්‍රික්කවල ධීවර ගොවිපළ කලාප සංවර්ධනය	200.00
	405-2-03-077-2506 ලංකා ධීවර සංස්ථාව සම්පූර්ණයෙන් ප්‍රතිව්‍යුහගත කිරීම	40.35
		1,990.85
ජාතික ජල ජීවී වගා සංවර්ධන අධිකාරිය (NAQDA)	ප්‍රාග්ධන සංවර්ධනය (NAQDA)	75.00
ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනය (NARA)	405-2-04-002-2201 ප්‍රාග්ධන සංවර්ධනය (NARA)	195.00
	405-2-04-002-2507 ප්‍රාග්ධන සංවර්ධනය (NARA)	190.00
ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව (CFHC)	ප්‍රාග්ධන සංවර්ධනය (CFHC)	250.00
		710.00
		2,713.10

1.7 විදේශ ආධාර ලබන ව්‍යාපෘති වල තොරතුරු -2021

අනු අං.	ව්‍යාපෘතියේ නම	දායක නියෝජිතායතනය	ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වියදම රු.මිලියන	ව්‍යාපෘති කාල සීමාව
1	ධීවර කර්මාන්තයේ පසු අස්වනු පාඩු අවම කිරීම හරහා ආහාර සුරක්ෂිතතාව සහතික කිරීම : TCP/SRL/3803/C1	එක්සත් ජාතීන්ගේ ආහාර හා කෘෂිකර්ම සංවිධානය (FAO)	4.4	වසර 02
2	ශ්‍රී ලංකාව - නෝර්වේ ද්විපාර්ශ්වික ව්‍යාපෘතිය - ශ්‍රී ලංකාවේ මත්ස්‍ය සම්පත් කළමනාකරණය වැඩිදියුණු කිරීම සඳහා තාක්ෂණික සහාය අදියර 2	නෝර්වේජියානු තානාපති කාර්යාලය	208.3	වසර 02
3	වගාපාදක ධීවර කර්මාන්තයේ ඵලදායිතාවය, කාර්යක්ෂමතාවය හා තිරසාරභාවය වැඩි දියුණු කිරීම සඳහා ශ්‍රී ලංකාවේ ජලාශවල වරල් මත්ස්‍ය හා මිරිදිය ඉස්සන් වගාව	ජාත්‍යන්තර කෘෂිකාර්මික පර්යේෂණයන් සඳහා වන ඕස්ට්‍රේලියානු මධ්‍යස්ථානය	248.12	වසර 04

02. ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2021 වසර සඳහා රජය මගින් විසිතුරු මසුන් මිරිදිය මත්ස්‍ය හා ඉස්සන් ඇති කිරීම,ධීවර වරාය සංවර්ධන, බහුදින ධීවර කටයුතු හා මත්ස්‍ය අපනයන රාජ්‍ය අමාත්‍යාංශය සඳහා වෙන්කරන ලද සම්පූර්ණ අයවැය ප්‍රතිපාදන ප්‍රමාණය රු.මි.2,713.10 ක් වූ අතර ඉන් රු.මි. 1,796.05 ක ප්‍රමාණයක් 2021 වර්ෂය තුල වැය කොට ඇත.

එසේම, 2020 වර්ෂයේ මුලු මත්ස්‍ය නිෂ්පාදනය වූ මෙට්‍රික් ටොන් 428,740 ට සාපේක්ෂව 2021 ජනවාරි - දෙසැම්බර් දක්වා කාලපරිච්ඡේදය තුළදී මුළු මත්ස්‍ය නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 435,910 දක්වා වැඩි වී ඇත. 2020 වර්ෂයේදී මුලු මත්ස්‍ය නිෂ්පාදනය සඳහා කරදිය ධීවර කර්මාන්තයේ දායකත්වය මෙට්‍රික් ටොන් 326,930 හා මිරිදිය ධීවර කර්මාන්තයේ දායකත්වය මෙට්‍රික් ටොන් 101,810 ක් වූ අතර 2021 වර්ෂයේදී කරදිය හා මිරිදිය ධීවර කර්මාන්තය පිළිවෙලින් මෙට්‍රික් ටොන් 331,675 ක් සහ මෙට්‍රික් ටොන් 104,235 ක් ලෙස මත්ස්‍ය නිෂ්පාදනයට දායක වී ඇත.

මහජනයාගේ පෝෂණ මට්ටම හා යහපත් සෞඛ්‍යය තත්ත්වය වර්ධනය කිරීම සඳහා ප්‍රෝටීන් මූලාශ්‍රයක් ලෙස මත්ස්‍ය පරිභෝජනය ඉතා වැදගත් වේ. 2021 ජනවාරි සිට දෙසැම්බර් දක්වා කාලය තුළ ඒක පුද්ගල මත්ස්‍ය පරිභෝජනය දිනකට ග්‍රෑම් 37.1 ක් වුවද එම ප්‍රමාණය ඉදිරි කාලය තුළ වැඩි වෙනු ඇතැයි අපේක්ෂා කෙරේ.

ජාතික ආදායමට ධීවර ක්ෂේත්‍රයේ දායකත්වය තවදුරටත් වර්ධනය කර ගැනීමට උත්සාහ කළ යුතුව ඇත. 2021 ජනවාරි සිට දෙසැම්බර් දක්වා කාලපරිච්ඡේදය තුලදී මුළු මත්ස්‍ය හා මත්ස්‍ය නිෂ්පාදන අපනයනය මෙට්‍රික් ටොන් 26,749 කි. අපනයන වටිනාකම රු.මි. 63,222 (ඇ.ඩො.මි.318.04) ක් ලෙස වාර්තා වී ඇත. මෙය වාර්තාගත ඉහළම මත්ස්‍ය හා මත්ස්‍ය නිෂ්පාදන අපනයන ආදායම වූ අතර 2020 වර්ෂය හා සසඳන කල 58.6 % ක ඉහළ යාමකි. අදාල කාල පරිච්ඡේදය තුළ මත්ස්‍ය ආනයනය මෙට්‍රික් ටොන් 56,176 ක් වූ අතර එහි වටිනාකම රු මිලියන 25,080 (ඇ. ඩො. මි.126.17) කි. සමස්ත වෙළෙඳ ශේෂය රුපියල් මිලියන 38,142කි. (ඇ.ඩො.මි.191.87). 2020 වර්ෂය හා සසඳන කල මත්ස්‍ය නිෂ්පාදන ආනයන වියදම 29.4% කින් අඩු වී ඇත. ටින් මාලු ආනයනය 64.2% කින් හා ශීතකල මසුන් ආනයනය 54.1% කින් අඩු වීම කැපී පෙනේ. තවද, විසිතුරු මසුන් අපනයනයෙන් එකී කාලපරිච්ඡේදය තුළදී රු.මි.4,193 (ඇ.ඩො.මි.21.09) ක ආදායමක් උපයා ඇත. එම වටිනාකම 2020 වසරෙහි විසිතුරු මසුන් අපනයන වටිනාකම හා සලකන 74 % ක වැඩි වීමකි. ඉස්සන් වගාව තීව්‍රකරණය හා නවීකරණයෙහි ප්‍රතිඵලයක් ලෙස ඉස්සන් අපනයනය 2020 හා සසඳන කල 2021 දී 166.5 % ක ඉහළ යාමක් පෙන්නුම් කරයි.

2021 වර්ෂයේ ‘‘සෞභාග්‍යයේ දැක්ම’’ ප්‍රතිපත්ති ප්‍රකාශනයට අනුව ජනතා කේන්ද්‍රීය ආර්ථික ,සමාජීය හා පාරිසරික අංශවලින් සමෘද්ධිමත් දේශයක් ගොඩනැගීමේ වත්මන් රජයේ

වැඩපිළිවෙලට සමගාමීව අඩු අදායම් ලාභී පවුල් ඉලක්ක කර ආර්ථිකය නඟා සිටුවීම සඳහා "ධීවර සහ ජලජීවී වගා ජීවනෝපාය" ව්‍යාපෘති සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී. මෙයට සෘජුවම ප්‍රතිපාදන සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය හරහා ලැබුණි. මෙම වැඩසටහන යටතේ පළමු වාරිකය ලෙස ප්‍රතිලාභීන් 2,277ක් සඳහා රු.මි.168.8 ක් සහ දෙවන වාරික මුදල ලෙස ප්‍රතිලාභීන් 1,707 ක් සඳහා රු.මි.97.2 ක් ලෙස ප්‍රතිපාදන වැයකර ඇත.

2021 වර්ෂයේ ප්‍රතිපාදන භාවිත කර ධීවර ක්ෂේත්‍රය තුළ ව්‍යාපෘති රාශියක් ක්‍රියාත්මක කර ඇත. මෙකී ව්‍යාපෘති අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රතිපත්ති ප්‍රකාශනය වූ "සෞභාග්‍යයේ දැක්ම" හා විසිතුරු මසුන් , මිරිදිය මත්ස්‍ය හා ඉස්සන් ඇති කිරීම, ධීවර වරාය සංවර්ධන, බහුදින ධීවර කටයුතු හා මත්ස්‍ය අපනයන රාජ්‍ය අමාත්‍යාංශය වෙත පැවරී ඇති සුවිශේෂ කාර්යයන් පදනම් කරගෙන ක්‍රියාත්මක කෙරේ. ධීවර වරාය සංවර්ධනය, අභ්‍යන්තර ධීවර කර්මාන්තය සංවර්ධනය සඳහා මත්ස්‍ය පැටවුන් තැන්පත් කිරීම , මත්ස්‍ය බීජ නිෂ්පාදනය සඳහා ප්‍රජා කණ්ඩායම්, ධීවර සමිති හා පෞද්ගලික අංශය සහභාගි කරවා ගැනීම සඳහා වූ වැඩ සටහනක් ක්‍රියාත්මක කිරීම , ජලජීවී වගා සංවර්ධන අධිකාරියෙහි මත්ස්‍ය අභිජනන හා මත්ස්‍ය බීජ නිෂ්පාදන ධාරිතාවය පුලුල් කිරීම , විසිතුරු මත්ස්‍ය අභිජනන මධ්‍යස්ථානයන්හි අභිජනන ධාරිතාවය ඉහළ නැංවීම, නව මත්ස්‍ය ප්‍රභේද හඳුන්වා දීම තුළින් අපනයන මත්ස්‍ය පරාසය පුලුල් කිරීම රාජ්‍ය අමාත්‍යාංශය යටතේ සිදු කරන ලදී . 2021 වසර තුල ජලාශ සඳහා මත්ස්‍ය පැටවුන් මිලියන 110.85 ක් හා මිරිදිය ඉස්සන් පැටවුන් මිලියන 52.16 ක් තැම්පත් කරන ලදී. මත්ස්‍ය පැටවුන් නිෂ්පාදනය සඳහා ප්‍රජා මූලික අභිජනන ඒකක, ධීවර සමිති මඟින් සිදු කරනු ලබන කුඩුවල මත්ස්‍ය පැටවුන් නිෂ්පාදනය සහ පෞද්ගලික අංශය මඟින් කැපී පෙනෙන දායකත්වයක් ලබා ගැනීම විශේෂ ලක්ෂණයකි. මුහුදු කූඩැල්ලන් වගාව ප්‍රචලිත කිරීම සඳහා අවශ්‍ය පියවර ගන්නා ලද අතර උතුරු පළාතේ ප්‍රජා සහභාගිත්වයෙන් මුහුදු කූඩැල්ලන් අපනයන ගම්මාන 2 ක් පිහිටවන ලදී. ඉස්සන් වගාව ව්‍යාප්තිය සහ තීව්‍රකරණය සඳහා කෘෂිකර්ම නවීකරණ ව්‍යාපෘතිය හරහා පහසුකම් සැලසිණි.

එසේම ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනය සිය පර්යේෂණයන්ට අනුව මත්ස්‍ය පසු අස්වනු හානිය 40% - 60% වන බව පෙන්වා දෙමින් එම තත්වය අවම කරගැනීමට උචිත ක්‍රමෝපායන් නිර්දේශ කොට ඇත. ධීවරයන්ගේ දැනුවත්භාවය වැඩිකිරීම, නවීන පහසුකම්වලින් සමන්විත වන පරිදි යාත්‍රා නිෂ්පාදනය හා නවීකරණය කිරීම, ගුණාත්මක අයිස් හා ජලය භාවිත කිරීම, විධිමත් ලෙස මත්ස්‍ය අස්වැන්න නෙලීම හා ගොඩබෑම, ශීතාගාර පහසුකම් සැපයීම, පවිත්‍ර ජල පහසුකම් වලින් සමන්විත වරායන් පවත්වාගෙන යාම ආදී ක්‍රියාදාමයන් රාශියක් දැනට ක්‍රියාත්මක වෙමින් පවතී. නව වරායන් හා නැංගුරම්පළ ඉදිකිරීම හා පවත්නා ස්ථාන නව තාක්ෂණයෙන් යුක්තව ප්‍රතිසංස්කරණය කිරීමේදී මේ සම්බන්ධව විශේෂ අවධානයක් යොමු කොට ඇත.

ධිවරයන් සඳහා අවශ්‍ය ශීතාගාර පහසුකම්, අයිස් සැපයීම සහ අනෙකුත් සේවාවන් සැපයීම සඳහා පෞද්ගලික ආයෝජකයන් සම්බන්ධ කරගැනීමේ වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක වේ.දේශීය ටින්මාලු නිෂ්පාදනය ප්‍රවර්ධනය සඳහා පහසුකම් සලසන ලද අතර මෙ වන විට ටින් මාලු කර්මාන්ත ශාලා 8 ක් ක්‍රියාත්මක වේ.

ලංකා ධීවර සංස්ථාවෙහි අලෙවි ජාලය පුලුල් කිරීමේ වැඩ සටහන යටතේ මෙගා වෙළඳසලක්ද ඇතුලුව නව වෙලදසල් 11 ක් 2021 වර්ෂය තුළ ස්ථාපනය කර ඇත.

විසිතුරු මසුන් , මිරිදිය මත්ස්‍ය හා ඉස්සන් ඇති කිරීම,ධිවර වරාය සංවර්ධන, බහුදින ධිවර කටයුතු හා මත්ස්‍ය අපනයන රාජ්‍ය අමාත්‍යාංශය ගරු ජනාධිපතිතුමාගේ "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශනය සහ රාජ්‍ය අමාත්‍යාංශය වෙත පැවරී ඇති සුවිශේෂ ප්‍රමුඛතා පදනම් කර ගනිමින් 2020-2025 පස් අවුරුදු සැලැස්ම සකස් කර ක්‍රියාත්මක කෙරේ.

- වෙරළාසන්න මත්ස්‍ය ගහනයන් අධ්‍යනයන් තවදුරටත් පුලුල්ලෙස සිදුවන අතර කරන ලද අධ්‍යයනයකට අනුකූලව බටහිර වෙරළාසන්න මුහුදේ කුඩා සමුද්‍රීය මත්ස්‍ය විශේෂ ගහණ කළමනාකරණය සඳහාත්, දකුණු මුහුදේ පොකිරිස්සන් ගහන කළමනාකරණය සඳහාත් සැලැස්මක් පිළියෙල කර ධිවර ප්‍රජා සහභාගිත්වයෙන් ක්‍රියාත්මක කිරීමට කටයුතු කරමින් පවතී.
- අවශ්‍යතාවයන් සැපිරීම සඳහා නව ධීවර වරායන් ඉදි කිරීම සිදු වන අතර දැනට පවතින වරායන්හි පවතින පහසුකම් පුලුල් කිරීම සිදු කරමින් පවතී. එලෙසම ධීවර ප්‍රජාව සඳහා අවශ්‍ය අයිස් ශීතාගාර පහසුකම් යනාදී පහසුකම් පෞද්ගලික ආයෝජකයන්ගේ සහභාගිත්වයෙන් සැපයීමට වැඩ පිළිවලක් ක්‍රියාත්මක වේ.
- බහුදින ධිවර යාත්‍රාවන්හි සිදුවන පසු අස්වනු හානිය අවම කිරීමේ අරමුණින් බහුදින යාත්‍රා සඳහා වඩා කාර්යක්ෂම ශීතකරණ පද්ධති හඳුන්වා දීම සඳහා කටයුතු සිදුවෙමින් පවතින අතර, පෞද්ගලික අංශය මගින් අලුතින් හඳුන්වාදෙන යාත්‍රා කාර්යක්ෂම ශීතකරණ පද්ධති වලින් සමන්විත බවට සහතික කිරීම සඳහා අවශ්‍ය රෙගුලාසි සකස්කර ක්‍රියාත්මක කරනු ලැබේ.
- සියලුම බහුදින ධීවර යාත්‍රා සඳහා VMS පද්ධති ස්ථාපනය කිරීම ආරම්භ කර ඇති අතර මේ තුළින් නීත්‍යානුකූල නොවූ , නියාමනය නොවූ හා වාර්තා නොවන (IUU) ධීවර කටයුතු පාලනය කෙරෙනු ඇත.
- මත්ස්‍ය අස්වනු වල වටිනාකම් ජාලය (Value Chain) හරහා සිදුවන පසු අස්වනු හානිය අවම කිරීම සඳහාද වැඩ සටහන් ගණනාවක් ක්‍රියාත්මක කෙරේ..
- ග්‍රාමීය ප්‍රදේශ වල ජනතාවට පහසු මිලට ගුණාත්මක මසුන් සැපයීම , ජීවනෝපාය අවස්ථා සැපයීම සහ ග්‍රාමීය ආර්ථිකය ශක්තිමත් කිරීමේ අරමුණින් ජලාශයන්හි මත්ස්‍ය පැටවුන් තැන්පත් කිරීමේ වැඩ සටහන් වඩා පුලුල්ව ක්‍රියාත්මක කෙරේ. මේ සමඟම ජලාශවල කළමනාකරණය ඉහළ නැංවීම තුළින් තිරසාර බව සහතික කිරීමට කටයුතු කෙරේ.

- ඉහළ වටිනාකමක් සහිත අපනයන ඉල්ලුමක් සහිත ඉස්සන් , මුහුදු කුඩැල්ලන්, ජලජ පැළෑටි, මුහුදු වරල් මසුන් වැනි ජල ජීවී විශේෂයන් පෞද්ගලික ආයෝජන තුලින් ප්‍රවර්ධනය කෙරෙන අතර කුඩා පරිමාණ ජලජීවී වගාවන් ජීවනෝපාය සංවර්ධනය අරමුණු කරමින් ක්‍රියාත්මක කෙරේ.
- මත්ස්‍ය නිෂ්පාදන අපනයනය ඉහළ නැංවීම සහ මත්ස්‍ය නිෂ්පාදන ආනයනයන් අඩු කිරීම අරමුණු කර ගනිමින් ජලජීවී වගාව ප්‍රවර්ධනය , පසු අස්වනු හානිය අවම කිරීම , දේශීය වශයෙන් ගුණාත්මක ටින් මාළු, කරවල හා උම්බලකඩ නිෂ්පාදනය තව දුරටත් ඉහළ නැංවීම සඳහා පෞද්ගලික අංශය දිරිමත් කරමින් වැඩ සටහන් තව දුරටත් ක්‍රියාත්මක කෙරේ.
- විශේෂයෙන්ම මිරිදිය ජලාශවල මත්ස්‍ය නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා අවශ්‍ය වන මත්ස්‍ය පැටවුන් නිෂ්පාදනය ප්‍රජා කණ්ඩායම් වල සහභාගිත්වයෙන් සිදු කිරීම සඳහාද අවශ්‍ය පහසුකම් සැලසීම තවදුරටත් සිදුවේ.
- විසිතුරු මත්ස්‍ය කර්මාන්තයෙහි මෙන්ම අනෙකුත් ජලජීවී වගා ක්ෂේත්‍රයන්හි නියැලී සිටින පිරිස් වෙත NVQ සුදුසුකම් ලබා දීමේ වැඩ පිළිවෙළ වඩාත් පුලුල් ලෙස ක්‍රියාත්මක කෙරේ.
- නිෂ්පාදකයාට සහ පාරිභෝගිකයාට ද සාධාරණය ඉටුවන ආකාරයට ලංකා ධීවර සංස්ථාවෙහි අලෙවි ජාලය තව දුරටත් ව්‍යාප්ත කෙරේ.

තවද අතිගරු ජනාධිපතිතුමන් විසින් පාර්ලිමේන්තුවේදී ඉදිරිපත් කරන ලද නව රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශනය තුළින් මත්ස්‍ය හා මත්ස්‍ය නිෂ්පාදන වල අපනයන හැකියාව වර්ධනය කරලීම සහ ධීවර අංශය වැඩි දියුණු කිරීම සඳහා ක්‍රමවත් වැඩ පිළිවෙළක් හඳුන්වා දී ඇති අතර සාගරය මත පදනම් වූ ආර්ථිකයක් බිහි කරලීමේ අවශ්‍යතාවය අවධාරණය කර ඇත.
සමස්තයක් ලෙස 2021 වර්ෂය තුල සියලු අභියෝග ජයගනිමින් අපේක්ෂිත ඉලක්ක සාධනය තුලින් සතුටුදායක ප්‍රතිඵල හා ජයග්‍රහණයන් ලබාගත හැකිවූ අතර, එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමටද , එසේම ඉදිරි වර්ෂ තුල රජයේ ජනතා අභිලාෂයන් ඉටුකරගැනිමට අවශ්‍ය සැලසුම් හා ව්‍යාපෘති කෙරේ විශේෂ අවධානයක් යොමු කොට ඇත.

කොවිඩ් වසංගතය හමුවේ අපේක්ෂා කළ පරිදි සාධනීය ප්‍රතිඵල සාක්ෂාත් කර ගැනීම දුෂ්කර වුවද සෞභාග්‍යයේ දැක්ම පදනම් කරගත් රාජ්‍ය ප්‍රතිපත්තියත්,ධීවර අංශයට අදාල වූ ප්‍රතිපත්තියත් ක්‍රියාවට නැංවීම තුලින් ඉදිරි වර්ෂ තුල සියළු අභියෝග ජය ගනිමින් අපේක්ෂිත අභිලාශයන් සාධනය කර ගැනීම තුලින් ධීවර අංශයේ වර්ධනය සවිමත් කර ගැනීමට මහත් රුකුලක් වනු ඇත.

03. 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය

3.1. මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

ඒසීඒ -එල්

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ කාල සීමාව සඳහා වන මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

රු.

අයවැය (2021)		සටහන	තක්සා 2021	2020	
-	**ආදායම් ලැබීම්**		-	-	
-	ආදායම් බදු	1	-	-	
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	ඒසීඒ -1
-	අන්තර්ජාතික වෙළඳාම මත බදු	3	-	-	
-	බදු නොවන ආදායම් සහ වෙනත්	4	-	-	
-	**මුළු ආදායම් ලැබීම් (අ)**		-	-	
-	**ආදායම් නොවන ලැබීම්**		-	-	
-	භාණ්ඩාගාර අග්‍රිම		1,813,865,000	1,057,813,197	ඒසීඒ -3
-	තැන්පතු		34,815,065	218,354,708	ඒසීඒ -4
-	අත්තිකාරම් ගිණුම්		529,469	88,136	ඒසීඒ - 5/5(අ)
	වෙනත් ලැබීම්		-	414,500	
-	**මුළු ආදායම් නොවන ලැබීම් (ආ)**		1,849,209,534	1,276,670,541	
-	**මුළු ආදායම් ලැබීම් හා ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)**		**1,849,209,534**	1,276,670,541	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)		550	-	
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඇ)		1,849,208,984	1,276,670,541	
	අඩු කළා : වියදම්				
-	**පුනරාවර්තන වියදම්**		-	-	
53,100,000	වේතන, වැටුප් සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	35,430,431	11,871,827	

35,600,000	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	34,074,396	8,911,575	ඒසිඒ - 2(II)
1,363,900,000	සහනාධාර, සහනාධාර ප්‍රදාන සහ මාරුකිරීම්	7	1,395,250,466	1,273,905,000	
-	පොළී ගෙවීම්	8	-	-	
-	වෙනත් පුනරාවර්තන වියදම්	9	-	-	
1,452,600,000	**මුළු පුනරාවර්තන වියදම් (ඊ)**		**1,464,755,293**	1,294,688,402	
	මූලධන වියදම්				
7,100,000	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	10	3,811,049	1,194,394	
3,000,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	2,321,463	453,424	ඒසිඒ-2(II)
400,000,000	ප්‍රාග්ධන පැවරීම්	12	310,280,000	519,973,000	
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	13	-	-	
400,000	හැකියා වර්ධනය	14	5,000	-	
2,060,500,000	වෙනත් මූලධන වියදම්	15	1,479,816,882	1,976,371,800	
2,471,000,000	**මුළු මූලධන වියදම් (උ)**		**1,796,234,394**	2,497,992,618	
	ප්‍රධාන ලෙජර් වියදම්				
	තැන්පතු ගෙවීම්		122,636,086	20,717,174	ඒසිඒ -4
	අත්තිකාරම් ගෙවීම්		2,153,939	1,458,526	ඒසිඒ - 5/5(අ)
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්				
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		124,790,025	22,175,700	
	මුළු වියදම් එ = (ඊ+උ+ඌ)		3,385,779,712	3,814,856,720	
-	**දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)**		(1,536,570,728)	(2,538,186,179)	
	අග්‍රම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය		(1,536,570,728)	(2,538,186,179)	ඒසිඒ -7
	2021 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය		-	-	ඒසිඒ -3
			(1,536,570,728)	(2,538,186,179)	

3.2. මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-පී

2021 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

	සටහන	2021 රු.	2020 රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියක හා උපකරණ	ඒසීඒ-6	2,774,886.00	183,923.00
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසීඒ-5/5(ඒ)	2,994,860.00	1,370,390.00
මුදල් හා මුදල් සමාන දෑ	ඒසීඒ-3	-	-
මුළු වත්කම්		5,769,746.00	1,554,313.00
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		(106,822,203.00)	(196,287,600.00)
දේපළ පිරියත හා උපකරණ සංචිතය		2,774,886.00	183,923.00
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	ඒසීඒ-5(බී)		
ඵංගම වගකීම්			
කැන්පතු ගිණුම්	ඒසීඒ-4	109,816,513.00	197,637,533.00
අග්‍රිම ශේෂය	ඒසීඒ-3	550.00	20,457.00
මුළු වගකීම්		5,769,746.00	1,554,313.00

පිටු අංක 01 සිට 51 දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් කොරතුරු සහ සටහන් පිටු අංක 52 සිට 59 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් හෙළදිරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් කොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් ව්‍යාකාරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

ප්‍රධාන ගණන්දීමේ නිලධාරි	ගණන්දීමේ නිලධාරි	ප්‍රධාන ගණකාධිකාරි
නම :	නම :	නම :
තනතුර :	තනතුර :	දිනය :2022.02.24
ආර්.එම්.අයි. රත්නායක 2022/02/24	දිනය : 2022/02/24	
ලේකම්	ජයන්ත චන්දසෝම	කේ.ටී.එන්. මනෝහර
දිවර අමාත්‍යාංශය	ලේකම්	ප්‍රධාන ගණකාධිකාරී
02 වන මහල, නව මහලේකම් කාර්යාලය	එසිතුරු මසුන්, මිරිදිය මත්ස්‍ය හා ඉස්සන් ඇති කිරීම,	එසිතුරු මසුන්, මිරිදිය මත්ස්‍ය හා ඉස්සන් ඇති කිරීම,
මාලිගාවත්ත, කොළඹ - 10.	දිවර වරාය සංවර්ධන, බහුදින දිවර කටයුතු හා	දිවර වරාය සංවර්ධන, බහුදින දිවර කටයුතු හා
	මත්ස්‍ය අපනයන රාජ්‍ය අමාත්‍යාංශය	මත්ස්‍ය අපනයන රාජ්‍ය අමාත්‍යාංශය
	නව මහ ලේකම් කාර්යාලය, මාලිගාවත්ත.	නව මහ ලේකම් කාර්යාලය, මාලිගාවත්ත. කොළඹ 10
	කොළඹ 10	

3.3. මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

ඒසිඒ-සි

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් කාල වර්ෂය සඳහා වන මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

	කත්‍ය	
	2021 රු.	2020 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		-
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	821,645	414,500
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතුකරන ලද ආදායම්	180,000	-
අග්‍රිම ලැබීම්	1,813,865,000	1,057,813,197
අත්තිකාරම් අයකර ගැනීම්	315,426	88,136
තැන්පතු ලැබීම්	34,815,475	10,220,838
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**1,849,997,546**	**1,068,536,671**
අඩුකළා : මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	68,769,757	20,783,402
සහනාධාර සහ මාරු කිරීම් වියදම්	28,465	1,273,905,000
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	269,881,979	(2,742,236,069)
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	550	20,458
අත්තිකාරම් ගෙවීම්	1,908,939	250,000
තැන්පතු ගෙවීම්	23,453,461	17,821,262
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**364,043,151**	**(1,429,455,947)**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	**1,485,954,395**	**2,497,992,618**
		2,497,992,618
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ	-	-

හිමිකම් ඉවත් වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම	-	-
උපණය අයකර ගැනීම	-	-
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඇ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම්	1,485,954,395	2,497,992,618
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	**1,485,954,395**	**2,497,992,618**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඇ)-(ඉ)	**(1,485,954,395)**	**(2,497,992,618)**
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	-	-
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)-(ඒ)	-	-
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	-	-
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	-	-

3.4. මූල්‍ය ප්‍රකාශ සටහන්

<u>වාර්තාකිරීමේ පදනම</u>

1) <u>වාර්තාකරණ කාලපරිච්ඡේදය</u>

2021 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

2) <u>මිනුම්කරණ පදනම</u>

මූල්‍ය ප්‍රකාශ ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම් නැවත තක්සේරු කරන ලද වටිනාකමට ඉදිරිපත් කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි.

මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

3) <u>ආදායම් හඳුනාගැනීම</u>

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොසලකා, මුදල් ලැබෙන කාලපරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

4) <u>දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම</u>

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

5) <u>දේපළ, පිරියත හා උපකරණ සංචිතය</u>

මෙම සංචිත ගිණුම දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම වේ.

6) <u>මුදල් හා මුදල් සමාන දෑ</u>

2021 දෙසැම්බර් 31 දිනට මුදල් හා මුදල් සමාන දෑ අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් සමන්විත වේ.

7) <u>මූල්‍ය ප්‍රකාශන ආකෘතියෙහි සිදුකරන ලද වෙනස්කම් හා පෙර වර්ෂයේ සංසන්දනාත්මක අගයන් නැවත ගැලපීම.</u>

2021 වසර සඳහා වන මූල්‍ය ප්‍රකාශන ආකෘතිවල සිදුකරන ලද වෙනස්කම් අනුව 2020 වසර සඳහා වන සංසන්දනාත්මක සංඛ්‍යාවල අදාළ ගැලපුම් සිදුකර ඇත.

3.5. ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

රු.000

ආදායම් ක්ෂේත්‍රය	ආදායම් ක්ෂේත්‍රයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		ඒකතු කරන ලද ආදායම	
		මුදල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස
	අදාල නොවේ				

3.6. වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

රු. 000

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තක්ෂ වියදම	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදනය	අවසාන ප්‍රතිපාදනය		
පුනරාවර්තන	1,452,600,000	1,512,805,898	1,464,755,293	97%
ප්‍රාග්ධන	2,471,000,000	2,713,096,000	1,796,234,394	66%

3.7. මුරෙ. 208 ප්‍රකාරව, වෙනත් වෙනත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු වල නියෝජිතයකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

රු. 000

අනු අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන		තක්ෂ වියදම	උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදන වල % ලෙස
			මුල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		
1	සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය	සමෘද්ධි පවුල් ලක්ෂ දෙකක් සවිබලගැන්වීම 2021 අයවැය යෝජනා යටතේ ක්‍රියාත්මක කිරීමට යෝජිත ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘති	0.00	270,000,000.00	269,881,979.19	100%

3.8. මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

රු. 000

වත්කම් කේතය	කේත විස්තරය	31.12.2021 දිනට භාණ්ඩ සම්ක්ෂණ වාර්තාව අනුව ශේෂය	31.12.2021දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේදි ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්	නැත	නැත		
9152	යන්ත්‍රෝපකරණ				
9153	ඉඩම්				
9154	අස්පෘශ්‍ය වත්කම්				
9155	ජීව විද්‍යාත්මක වත්කම්				
9160	කෙරීගෙන යන වැඩ				
9180	බදු දෙන ලද වත්කම්				

3.9. විගණකාධිපතිවරයාගේ වාර්තාව**

**පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමේදී, විගණකාධිපතිවරයා විසින් නිකුත් කරන ලද අවසාන විගණන වාර්තාව පරිලොකනය (SCAN) කොට මෙහි අන්තර්ගත කළ යුතුය.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. FLS/B/SMOIPFMF/2/21/01 මෙබ අංකය உமது இல. Your No.

දිනය திகதி Date 2022 ජූනි 24 දින

ප්‍රධාන ගණන්දීමේ නිලධාරි
ධීවර අමාත්‍යාංශය

විසිතුරු මසුන්, මිරිදිය මත්ස්‍ය හා ඉස්සන් ඇති කිරීම, ධීවර වරාය සංවර්ධන, බහුදින ධීවර කටයුතු හා මත්ස්‍ය අපනයන රාජ්‍ය අමාත්‍යාංශයේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

---

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **තත්ත්වාගණනය කළ මතය**

විසිතුරු මසුන්, මිරිදිය මත්ස්‍ය හා ඉස්සන් ඇති කිරීම, ධීවර වරාය සංවර්ධන, බහුදින ධීවර කටයුතු හා මත්ස්‍ය අපනයන රාජ්‍ය අමාත්‍යාංශයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විසිතුරු මසුන්, මිරිදිය මත්ස්‍ය හා ඉස්සන් ඇති කිරීම, ධීවර වරාය සංවර්ධන, බහුදින ධීවර කටයුතු හා මත්ස්‍ය අපනයන රාජ්‍ය අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට විසිතුරු මසුන්, මිරිදිය මත්ස්‍ය හා ඉස්සන් ඇති කිරීම, ධීවර වරාය සංවර්ධන, බහුදින ධීවර කටයුතු හා මත්ස්‍ය අපනයන රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව විසිතුරු මසුන්, මිරිදිය මත්ස්‍ය හා ඉස්සන් ඇති කිරීම, ධීවර වරාය සංවර්ධන, බහුදින ධීවර කටයුතු හා මත්ස්‍ය අපනයන රාජ්‍ය අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව විසිතුරු මසුන්, මිරිදිය මත්ස්‍ය හා ඉස්සන් ඇති කිරීම, ධීවර වරාය සංවර්ධන, බහුදින ධීවර කටයුතු හා මත්ස්‍ය අපනයන රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය

ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම් ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට ,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර නිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර නිබුණි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 අග්‍රිම සැසඳුම් ප්‍රකාශය

මූල්‍ය ප්‍රකාශනයේ ACA-7 අග්‍රිම සැසඳුම් ප්‍රකාශයේ සීවර අමාත්‍යාංශයට මාරුකළ තැන්පතු ශේෂය ලෙස දැක්වෙන මුදල රු.99,182,625 ක් වුවද රාජ්‍ය අමාත්‍යාංශයේ පොදු තැන්පතු ලේඛනයේ අංක 6000-0-0-16-0-140 දරන කොන්ත්‍රාත් සඳහා වූ රැඳවුම් මුදල් තැන්පතු යටතේ 2021 සැප්තැම්බර් 30 දින කරන ලද ජ'නල් සටහන අනුව එම ශේෂය රු.97,478,512 ක් වීම හේතුවෙන් රු.1,704,113 ක වෙනසක් නිරීක්ෂණය විය. තව ද එම මාරුකිරීම සඳහා ජ'නල් වවුචරයක් ද පිළියෙල කර නොතිබුණි.

1.6.2 අත්තිකාරම් සීමා

සමාලෝචිත වර්ෂයේ රාජ්‍ය අමාත්‍යාංශයේ ශීර්ෂ අංක 40501 දරන රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් "බී" ගිණුම් කටයුතුවල උපරිම වියදම් සීමාව, අවම බැර සීමාව හා උපරිම හර ශේෂ සීමාව පිළිවෙලින් රු.2,500,000 ක් රු.300,000 ක් හා රු.3,200,000 ක් ලෙස සීමාවන් වෙනස් කිරීම සඳහා ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් මුදල් අමාත්‍යවරයා වෙත නිර්දේශ කිරීමට කටයුතු කරන බව දැනුම් දී තිබුණ ද මෙම වාර්තාවේ දිනය වන විටත් එම සීමාවන් අනුමත කළ බවට කොරතුරු රාජ්‍ය අමාත්‍යාංශය විසින් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. තව ද විගණනයට ඉදිරිපත් කරනු ලැබූ මූල්‍ය ප්‍රකාශනයේ ACA-5 ආකෘතියෙහි එම ප්‍රතිශෝධිත සීමාවන් දක්වනු වෙනුවට විසර්ජන පනතින් අනුමත සීමාවන් වූ පිළිවෙලින් රු.3,000,000 ක් රු.750,000 ක් හා රු.5,000,000 ක් දක්වා තිබීම නිසා අවම බැර සීමාවට ලහා වී නොතිබුණි.

1.6.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

(අ) රාජ්‍ය ආයතන 3 ක් සඳහා වාර්ෂික වියදම් ඇස්තමේන්තු ප්‍රතිපාදන යටතේ පුනරාවර්තන වියදම් සඳහා රු.1,363,600,000 ක් හා මූලධන වියදම් සඳහා රු.650,000,000 ක් වෙන්කර තිබුණු අතර ශීර්ෂ අංක 990 යටතේ භාණ්ඩාගාරයෙන් දැරූ සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන වියදම රු.1,395,222,000 ක් හා මූලධන වියදම් රු.310,280,000 ක් වශයෙන් එකතුව රු.1,705,502,000 ක් විය. රාජ්‍ය අමාත්‍යාංශය විසින් රාජ්‍ය ආයතන තුනේ මෙම වියදම්වලට අදාල තොරතුරු ඉදිරිපත් නොකිරීම හේතුවෙන් පහත දැක්වෙන වියදම් අදාල කාර්යයන්වලටම වැය කළේ ද යන්න පරීක්ෂා කළ නොහැකි විය.

(i) අංක 405-2-4-2-1509 දරන නාරා ආයතනයේ වෙනත් මෙහෙයුම් වියදම් වැය විෂයය යටතේ රු.43,600,000 ක මූලික ඇස්තමේන්තුවට X-Press Pearl නෞකාව ගිනි ගැනීම සම්බන්ධයෙන් සිදු වූ බලපෑම තක්සේරු කිරීමට අදාල පර්යේෂණ කටයුතු සඳහා 2021 ජුනි 07 දින හා 2021 අගෝස්තු 10 දින

පිළිවෙලින් රු.35,770,000 ක් හා රු.14,230,000 ක් වශයෙන් එකතුව රු.50,000,000 ක අතිරේක ප්‍රතිපාදන ලබා දී තිබීම හේතුවෙන් සංශෝධිත ඇස්තමේන්තුව රු.93,600,000 ක් විය. වර්ෂය අවසානයේ රු.77,155,000 ක් වියදම් කර තිබුණ ද එම පර්යේෂණ කටයුතුවල සාර්ථකත්වය පිළිබඳ විස්තර රාජ්‍ය අමාත්‍යාංශය විසින් විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ii) නාරා ආයතනයේ පර්යේෂණ හා සංවර්ධන වියදම් සඳහා වැයකර තිබුණු රු.110,000,000 ක් සම්බන්ධයෙන් ද සිදුකරනු ලැබූ පර්යේෂණ හා සංවර්ධන කටයුතු මොනවාද යන්න පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් නොවිය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 අග්‍රිම කළමනාකරණය

2021 දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාරය වෙත පියවිය යුතු අග්‍රිම ශේෂය රාජ්‍ය අමාත්‍යාංශයේ මුදල් පොත් අනුව රු.12,450,550 ක් වුවත් එම මුදල නොපියවා ඉන් රු.550 ක් පමණක් පියවා, ලංකා ධීවර සංස්ථාව වෙත රු.12,450,000 ක අක් මුදල් ලබාදීමට අංක 103 ගෙවීම් වවුචරය පිළියෙල කර තිබුණ ද ලංකා ධීවර සංස්ථාවට එම අක් මුදල ගෙවනවා වෙනුවට දින 28 කට පසුව එනම් 2022 ජනවාරි 28 දින භාණ්ඩාගාරයට ආපසු ලබාදීමට කටයුතු කර තිබුණු බව නිරීක්ෂණය විය. එහෙත් එම මුදල සමාලෝචිත වර්ෂයේ අංක 405-2-3-77-2506 දරන වැය විෂයය යටතේ වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණි.

2.2 වියදම් කළමනාකරණය

(අ) නාරා ආයතනය වෙත 2021 වර්ෂය සඳහා අංක 405-2-4-2-2507 දරන පර්යේෂණ හා සංවර්ධන වියදම් සඳහා වෙන්කර දෙන ලද රු.250,000,000 ක මුදල මුදල් රෙගුලාසි 66 මාරුකිරීම් යටතේ අංක 405-2-4-2-2201 දරන ප්‍රාග්ධන මාරුකිරීම් යටතේ ICPMS උපකරණ සඳහා රු.60,000,000 ක් මාරුකිරීම නිසා සංශෝධිත ඇස්තමේන්තුව රු.190,000,000 ක් විය. එම ප්‍රමාණයෙන් ද සියයට 42 කට සමාන රු.80,000,000 ක් උපයෝජනය කර නොතිබුණි.

(ආ) මුදල් රෙගුලාසි මාරුකිරීම් යටතේ රාජ්‍ය අමාත්‍යාංශයේ වැය විෂයය අංක 405-2-03-71-2506 යටතේ වූ සුදුවැල්ල ධීවර වරාය සංවර්ධනයට අදාල ප්‍රතිපාදනවලින් රු.60,000,000 ක් සහ නාරා ආයතනයේ පර්යේෂණ හා සංවර්ධන වියදම් ප්‍රතිපාදනයෙන් රු.60,000,000 ක් වශයෙන් එකතුව රු.120,000,000 ක් මාරු කර නාරා ආයතනයේ ප්‍රාග්ධන වත්කම් පුනරුත්ථාපනය සඳහා රු.30,000,000 ක්ද ප්‍රාග්ධන වත්කම් අත්පත් කරගැනීම් සඳහා රු.105,000,000 ක්ද විද්‍යාගාර නවීකරණය සඳහා රු.60,000,000 ක්ද වශයෙන් එකතුව රු.195,000,000 ක සංශෝධිත ඇස්තමේන්තුව 405-2-4-2-2201 යටතේ සකසා තිබුණි. එහෙත් 2021

වර්ෂය සඳහා රු.65,500,000 ක් පමණක් වැයකර තිබුණු බැවින් මුළු ප්‍රතිපාදනයෙන් සියයට 66 කට සමාන රු.129,500,000 ක් ඉතිරි වී තිබීම අනුව, මුදල් රෙගුලාසි යටතේ මාරුකළ මුළු මුදලම ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

(ඇ) ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව 2021 වර්ෂයට වැයකර තිබුණු රු.73,902,645 ක වියදම තුල රු.698,578 ක් හලාවත යටිතල පහසුකම් සංවර්ධනය යටතේ වැයකර තිබුණ ද එවැනි වැය විෂයයක් 2021 වර්ෂයට අදාලව වියදම් ඇස්තමේන්තුවක් සිදුකර නොතිබුණි. රඳවාගැනීමේ මුදල් රාජ්‍ය අමාත්‍යාංශය මගින් වෙන් කරවාගෙන ගෙවීම් සිදු කරන ලද බවට පිලිතුරු ලිපිය අනුව දක්වා තිබුණි.

2.3 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

3 මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යසාධනය

3.1.1 සැලසුම් කිරීම

රාජ්‍ය අමාත්‍යාංශයේ 2021 වර්ෂය සඳහා වූ ඇස්තමේන්තුව මගින් සුවිශේෂී ප්‍රමුඛතා කාර්යයන් 8 ක් හඳුන්වා දී තිබුණ ද 2021 වර්ෂය සඳහා වූ ක්‍රියාකාරී සැලැස්මට හා ඒ අනුව පිළියෙල කළ ප්‍රගති වාර්තාවට අනුව වැව්, කලපු හා ගොඩ ඉඩම් ආශ්‍රිත මිරිදිය මත්ස්‍ය වගාව ප්‍රවලිත කිරීම සඳහා අවශ්‍ය ක්‍රමෝපායන් සැකසීම, මහ පරිමාණ මෙහෙයුම් කටයුතු කාර්යක්ෂමව සිදුකිරීම සඳහා ධීවර වරාය සංවර්ධනය කිරීම හැර අනෙකුත් පහත සඳහන් කාර්යයන් කෙරෙහි අවධානය යොමුකර සැලසුම් සකස් කර ක්‍රියාත්මක කර නොතිබුණි.

- අපනයන වෙළඳපොළ ඉලක්ක කරගත් විසිතුරු මත්ස්‍ය කර්මාන්ත ඇති කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම.
- බහුදින ධීවර යාත්‍රා සඳහා මුහුදු ජලය භාවිතා කර ශීතකරණ පද්ධති සංවර්ධනය කිරීම සහ සූර්ය බලශක්තිය භාවිතය දිරිමත් කිරීම.
- නවීන සන්නිවේදන පහසුකම්, ශීතකරණ, ඉන්ධන සැපයුම් සහ සනීපාරක්ෂක පහසුකම් සහිතව සහිතව සියලුම ධීවර වරායන්, නැංගුරම් ස්ථාන වැඩි දියුණු කිරීම්.

- මුහුදු හා මිරිදිය මත්ස්‍යයන් පුළුල් ලෙස බෝකිරීම සඳහා යිවර ප්‍රජා සංගම් හා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය සමඟ ඒකාබද්ධව වැඩසටහන් ආරම්භ කිරීම.
- පරිසර හිතකාමී නවීන අධි තාක්ෂණික ක්‍රම යොදා ගනිමින් මත්ස්‍ය අස්වැන්න ඉහළ නැංවීම සඳහා කටයුතු කිරීම.
- යිවරයින් සහ එම කර්මාන්තයේ නියැලෙන්නන්ගේ වෘත්තීමය පුහුණුව හා දැනුම දියුණු කිරීම.

3.1.2 කාර්යභාරයන් ඉටු නොකිරීම

(අ) 2021 වර්ෂයේ රාජ්‍ය ආයතන වෙත ප්‍රාග්ධන මාරුකිරීම් 2201 වැය විෂයය යටතේ ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය රු.400,000,000 ක් හා මුදල් රෙගුලාසි මාරුකිරීම් මඟින් රු.120,000,000 ක් සමඟ එකතුව රු.520,000,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් වියදම රු.310,280,000 ක් විය. විස්තර පහත දැක්වේ.

වැය විස්තරය	මූලික ප්‍රතිපාදනය	මුදල් රෙගුලාසි මාරුකිරීම්	ශුද්ධ ප්‍රතිපාදනය	වියදම
	රු.	රු.	රු.	රු.
405-2-4-1-2201 ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය	75,000,000	-	75,000,000	50,167,000
405-2-4-2-2201 ජාතික ජලජ සම්පත් පර්යේෂණ නියෝජිතායතනය	75,000,000	120,000,000	195,000,000	65,500,000
405-2-4-3-2201 ශ්‍රී ලංකා යිවර වරාය නීතිගත සංස්ථාව	250,000,000	-	250,000,000	194,613,000
	400,000,000	120,000,000	520,000,000	310,280,000

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ ප්‍රාග්ධන වත්කම් අත්පත් කරගැනීමට හා ප්‍රාග්ධන වත්කම් පුනරුත්ථාපනයට මූල්‍ය ප්‍රකාශනය අනුව සියයට 66.8 කට සමාන රු.50,167,000 ක් වැයකළ බව සඳහන් වුවද ක්‍රියාකාරී සැලැස්මට අනුව සැකසූ ප්‍රගති වාර්තාවේ මූල්‍ය ප්‍රගතිය සියයට 44.4 කට සමාන රු.44,410,000 ක් පමණක් බව දැක්වීම නිසා වියදමෙහි රු.5,757,000 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ii) අංක 405-2-4-2-2201 යටතේ නාරා ආයතනයේ ප්‍රාග්ධන වත්කම් අත්පත් කරගැනීමට, ප්‍රාග්ධන වත්කම් පුනරුත්ථාපනය කිරීමට හා විද්‍යාගාර නවීකරණය කිරීමට රාජ්‍ය අමාත්‍යාංශයෙන් ඉල්ලා තිබුණු එකතුව රු.195,000,000කින් වැය කරන ලද රු.65,500,000 ක මුදල සම්බන්ධ තොරතුරු රාජ්‍ය අමාත්‍යාංශය ලබාගෙන නොතිබුණු හෙයින් විගණනයේ දී පරීක්ෂා කිරීමට නොහැකි විය.

(iii) ශ්‍රී ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවේ සිවිල් ඉංජිනේරු වැඩ හා යාන්ත්‍රික ඉංජිනේරු වැඩ සඳහා වෙන්කර තිබුණු රු.250,000,000 ක ප්‍රාග්ධන අරමුදල්වලින් රු.194,613,000 ක් වැයකර තිබුණ ද ප්‍රගති වාර්තාවට අනුව වර්ෂයේ අවසානයේ මූල්‍ය ප්‍රගතිය ප්‍රතිපාදනය ඉක්මවා එනම් රු.287,260,000 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනයේ දැක්වෙන වියදම වූ රු.194,613,000 සමඟ සැසඳීමේ දී රු.92,647,000 ක වෙනසක් නිරීක්ෂණය විය. තව ද යාන්ත්‍රික ඉංජිනේරු වැඩ යටතේ සයුරු නැව අලුත්වැඩියාව සඳහා රු.23,000,000 ක සැලසුම් කර තිබුණු වැඩ සඳහා වියදම රු.14,640,000 ක් ටෙන්ඩර් කිරීම සඳහා පමණක් වූ බැවින් එම අලුත්වැඩියාව සම්බන්ධයෙන් භෞතික ප්‍රගතියක් ලබා නොතිබුණි.

(ආ) රාජ්‍ය අමාත්‍යාංශය, ධීවර කර්මාන්තයට අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය සඳහා 2506 වැය විෂයය යටතේ ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය මඟින් ක්‍රියාත්මක කරවන සංවර්ධන ව්‍යාපෘති 5 ක් සඳහා රු.1,672,500,000 ක් හා ශ්‍රී ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව මඟින් ක්‍රියාත්මක කරවන සංවර්ධන ව්‍යාපෘති 5 ක් සඳහා රු. 278,000,000 ක් හා ලංකා ධීවර සංස්ථාවට රු.40,350,000 ක් වශයෙන් 2021 වර්ෂයේ සංශෝධිත මුළු වියදම් ඇස්තමේන්තු ප්‍රතිපාදනය රු.1,990,850,000 ක් හා ඒ අනුව වියදම පිළිවෙලින් රු.1,283,256,961 ක්, රු.74,109,917 ක් හා රු.12,450,000 ක් වශයෙන් එකතුව රු.1,369,816,882 ක් විය. විස්තර පහත දැක්වේ.

සංවර්ධන ව්‍යාපෘතිය	ශුද්ධ ප්‍රතිපාදනය	වියදම
	රු.	රු.
405-2-3-52-2506		
මත්ස්‍ය අභිජනන ධාරිතාවය ඉහළ නැංවීම	550,000,000	414,646,258
405-2-3-61-2506		
අධිකාරියේ නඩත්තු කිරීම, පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම	372,000,000	250,974,435
405-2-3-69-2506		
වීසිතුරු මත්ස්‍ය නිෂ්පාදනය	250,500,000	192,173,032
405-2-3-74-2506		
මත්ස්‍ය අභිජනනාගාර වැඩිදියුණු කිරීම හා නව ඉදිකිරීම්	300,000,000	226,845,662
405-2-3-75-2506		
මඩකලපුව, යාපනය, පුත්තලම හා මන්නාරම දිස්ත්‍රික්කවල මත්ස්‍ය ගොවිපළ කලාප සංවර්ධනය	200,000,000	198,617,574
	1,672,500,000	**1,283,256,961**
405-2-3-68-2506		
මයිලෙඩ්ඩි ධීවර වරාය-ශීත කාමර සහ ගබඩා පහසුකම් පිහිටුවීම	67,000,000	63,529,700
405-2-3-70-2506		
හම්බන්තොට ධීවර වරාය සංවර්ධනය	20,000,000	1,054,749
405-2-3-71-2506		
සුදුවැල්ල ධීවර වරාය සංවර්ධනය	73,000,000	0
405-2-3-72-2506		
දොඩන්දුව ධීවර වරාය	100,000,000	7,625,468

405-2-3-73-2506 ගොඩබෑම් ස්ථාන සංවර්ධනය	18,000,000	1,900,000
	278,000,000	74,109,917
405-2-3-77-2506 ලංකා ධීවර සංස්ථාව ප්‍රතිව්‍යුහගත කිරීම	40,350,000	12,450,000
මුළු එකතුව	1,990,850,000	1,369,816,882

මේ අනුව රාජ්‍ය අමාත්‍යාංශය යටතේ වූ රාජ්‍ය ආයතන නියාමනය කිරීමේ දුර්වලතාවය නිසා අමාත්‍යාංශයේ අරමුණු ඉටුකර ගැනීමේ මන්දගාමී බවක් නිරීක්ෂණය විය.

(i) රාජ්‍ය අමාත්‍යාංශයේ කාර්යයන් ඉටුකරගැනීම සඳහා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය (NAQDA) වෙත පවරන ලද සංවර්ධන ව්‍යාපෘති 05 වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ වැය කර තිබුණු රු.1,283,256,961 ක් සම්බන්ධයෙන් වූ ගොනු විගණනයට ඉදිරිපත් නොවූ අතර එම ආයතනය විසින් එවන මාසික වියදම් සාරාංශ විස්තරවලින් පමණක් ලෙජර් ගිණුම් පවත්වා තිබුණි.

(ii) 2021 වර්ෂය සඳහා සුදුවැල්ල ධීවර වරාය සංවර්ධනයට මූලික වියදම් ඇස්තමේන්තුව මඟින් රු. 150,000,000 ක් වෙන්කර තිබුණ ද මුදල් රෙගුලාසි 66 මාරුකිරීම් කල පසු රු.73,000,000 ක්වූ සංශෝධිත ප්‍රතිපාදන මුදලම උපයෝජනය කර නොතිබුණු අතර එම කාර්යය කිරීම අවලංගු කර තිබුණි.

(iii) දොඩන්දුව ධීවර වරාය සංවර්ධනයට රු.100,000,000 ක ප්‍රතිපාදන සලසාගෙන තිබුණ ද රු.25,000,000 කට ඉලක්ක කළ කාර්යයන් සඳහා පමණක් රු.7,625,468ක වියදමක් දරා තිබුණු බැවින් අදාල කාර්යයේ භෞතික ප්‍රගතිය අඩු මට්ටමක විය.

(iv) හම්බන්තොට ධීවර වරාය සංවර්ධනයට 2021 වර්ෂය සඳහා රු.20,000,000ක ප්‍රතිපාදන සලසා තිබුණ ද රු. 9,000,000 කට අදාල කාර්යයක් පමණක් සැලසුම්කර ඒ සඳහා රු.1,054,749 ක් වැයකර තිබුණි.

(v) ගොඩබෑමේ ස්ථාන හා නැංගුරම්පළවල් 8 ක් සංවර්ධනයට රු. 18,000,000 ක් වෙන්කර තිබුණ ද මූලික වියදම් සඳහා රු. 1,900,000 ක් පමණක් වැය කිරීම හේතුවෙන් මූල්‍ය ප්‍රගතිය සියයට 11 ක් පමණක් විය.

3.2 **කළමනාකරණ දුර්වලතා**

ලංකා ධීවර සංස්ථාව ප්‍රතිව්‍යුහගත කිරීම සම්පූර්ණ කිරීම වෙනුවෙන් වූ කාර්යය ඉටුකිරීම සඳහා රාජ්‍ය අමාත්‍යාංශය විසින් ප්‍රමාණවත් කාලයක් ඇතිව පරිපූරක ප්‍රතිපාදනයක් ඉල්ලා නොතිබුණු හෙයින් 2021 දෙසැම්බර් 22 දින රාජ්‍ය අමාත්‍යාංශය වෙත ලැබී තිබුණු රු.40,350,000 ක පරිපූරක ප්‍රතිපාදනය සඳහා තවත් දින 07ක ප්‍රමාදයකින් එනම් 2021 දෙසැම්බර් 29 දින භාණ්ඩාගාරයෙන් අග්‍රිම ඉල්ලා තිබුණු අතර 2021 දෙසැම්බර් 31 දින රු.40,000,000ක අග්‍රිමය ලැබී තිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වන විට ප්‍රමාණවත් කාලයක් නොමැතිවීම හේතුවෙන් පරිපූරක ප්‍රතිපාදනයම ප්‍රයෝජනයට ගැනීමට නොහැකි වී තිබුණු අතර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට එම අග්‍රිමයෙන් රු.27,550,000ක් රාජ්‍ය අමාත්‍යාංශය විසින් ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය (NAQDA) වෙත සංවර්ධන වැය විෂයයන්ට වැය කිරීම සඳහා ගෙවා තිබුණු බව නිරීක්ෂණය විය. මේ අනුව එම මුදලින් අරමුණු වූ කාර්යයන් ඉටු වී තිබේ ද යන්න තහවුරු නොවිය.

එච්.එන්.රණතුංග

ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති

විගණකාධිපති වෙනුවට.

04. කාර්ය සාධන දර්ශක

4.1. ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම			
	100% - 90%	75% - 89%	50% - 74%	
2021 වර්ෂයේදී සමස්ත මත්ස්‍ය නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 482,420 කින් වැඩිකිරීම	√			$\frac{436,910}{482,420}$ X100= 90.56%
2021 වර්ෂයේදී එක් දිනක් තුළ ඒක පුද්ගල මත්ස්‍ය පරිභෝජනය ග්‍රෑම් 48 දක්වා වැඩි කිරීම		√		$\frac{37.1}{48}$ X100= 77.29%
2021 වර් ෂය තුළ මුලු මත්ස්‍ය හා මත්ස්‍ය නිෂ්පාදන අපනයන ප්‍රමාණය මෙට්‍රික් ටොන් 27,500 කින් වැඩි කිරීම.	√			$\frac{26,749}{27,500}$ X 100=97.26%

05. තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

5.1. හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු .

ඉලක්ක / අරමුණු	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයගුහණ ලබා ගැනීමේ ප්‍රගතිය			
			0% - 49%	50%- 74%	75%- 100%	
තිරසාර සංවර්ධන ඉලක්කය14	සමුද්‍ර මත්ස්‍ය නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 372,470කි	331,675 මෙට්‍රික් ටොන්			√	$\frac{331,675}{372,470} \times 100 = 89.04\%$
	මිරිදිය හා ජලජීවී වගා මත්ස්‍ය නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 109,950 කි.	104,235 මෙට්‍රික් ටොන්			√	$\frac{104,235}{109,950} \times 100 = 94.80\%$
	2021 දී ඒක පුද්ගල මත්ස්‍ය පරිභෝජනය දිනකට ග්‍රෑම් 48 දක්වා වැඩි කිරීම.	දිනකට 37.1 g			√	$\frac{37.1}{48} \times 100 = 77.29\%$

5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග.


ධීවර ක්ෂේත්‍රයේ තිරසාර සංවර්ධන ඉලක්ක ලභා කර ගැනීම

2022 වසර වන විට ඉලක්ක 14.6, අධික ධාරිතාව, අධික ලෙස මසුන් ඇල්ලීමට දායක වන විවිධාකාරයේ ධීවර සහනාධාර තහනම් කිරීම, නීති විරෝධී, වාර්ථා නොවූ හා නියාමනය නොවන මසුන් ඇල්ලීම සඳහා සහනාධාර ඉවත් කිරීම හා එබඳු නව සහනාධාර හඳුන්වා දීමෙන් වැළකීම, ලෝක වෙළඳ සංවිධානයේ ධීවර සහනාධාර සාකච්ඡා වලදී සංවර්ධිත හා උෞන සංවර්ධිත රාජ්‍යයන් විශේෂ හා වෙනස් කොට සැලකීම සම්බන්ධව සුදුසු සහ ඵලදායී පියවර හඳුනා ගැනීම.

14.6.1 දර්ශකය -නීති විරෝධී, වාර්තා නොවූ සහ නියාමනය නොවූ මසුන් ඇල්ලීම හා සම්බන්ධව අන්තර්ජාතික, නීත්‍යානුකූල ලේඛන ක්‍රියාත්මක කිරීමේ ප්‍රමාණය (බලධාරී දර්ශකය)

ඉන්දියානු සාගර ටූනා කොමිසමට අදාල නීති හා ගිවිසුම් සම්බන්ධව ශ්‍රී ලංකාවේ යිවර කර්මාන්තය අනුකූලතාවය දක්වන ප්‍රමාණය

වර්ෂය	අනුකූලතා අනුපාතය
2010	5%
2011	18%
2012	47%
2013	51%
2014	60%
2015	74%
2016	77%
2017	82%
2018	87%
2019	90%
2020	93%
2021	95%



2030 වන විට ඉලක්ක 14.7.1 - යිවර ජලජීවී වගා සහ සංචාරක ක්ෂේත්‍රය තිරසාර ලෙස කළමනාකරණය කිරීම ඇතුළුව සාගර සම්පත් තිරසාර ලෙස භාවිත කිරීම තුළින් ආර්ථික ප්‍රතිලාභ වැඩිකිරීම.

14.7.1 දර්ශකය - දියුණු වෙමින් පවතින කුඩා දූපත් රාජ්‍යයන්, ඌන සංවර්ධිත රටවල් සහ සියළුම රටවල් වල ධීවර කර්මාන්තය දළ ජාතික නිෂ්පාදනයෙහි අනුපාතයක් ලෙස පහත දැක්වේ.

විස්තරය	අංකනය	වටිනාකම්	ඒකක මිලියන	වර්ෂය
දළ දේශීය නිෂ්පාදිතය	දළ දේශීය නිෂ්පාදිතය	11,943,654	රු. මිලියන	2021
සාගරයේ මසුන් ඇල්ලීම සහ සාගර ජලජ ජීවී වගාව		99,679	රු. මිලියන	2021
මිරිදිය මසුන් ඇල්ලීම සහ සාගර ජලජ ජීවී වගාව		24,724	රු. මිලියන	2021
එකතු කල අගයෙන් යුතු ධීවර හා ජලජ සම්පත්	VA FIA	124,403	රු. මිලියන	2021
ධීවර හා ජලජ සම්පත් අංශයේ දළ දේශීය නිෂ්පාදනය	GDP FIA VA FIA/ GDP	1.0	ප්‍රතිශතය	2021
සාගරයෙන් අල්ලා ගත් මසුන් ප්‍රතිශතය සඳහා අගය එකතු කිරීම	VA = GDP *Q_M / Q_T	0.76	ප්‍රතිශතය	2021

මූලාශ්‍රය - ධීවර අමාත්‍යාංශයේ ජන හා සංඛ්‍යාලේඛන අංශය 2020

2022 වසර වන විට 14.4 අස්වනු නෙලීම සහ අධික ලෙස මසුන් ඇල්ලීම අවසන් කිරීම, නීති විරෝධී, වාර්තා නොවන සහ නියාමනය නොවන මසුන් ඇල්ලීම සහ විනාශකාරී මසුන් ඇල්ලීම ඵලදායි ලෙස නියාමනය කිරීම සහ ඔවුන්ගේ ජීව විද්‍යාත්මක අංග ලක්ෂණ අනුව උපරිම තිරසාර අස්වැන්නක් අවම වශයෙන් තීරණය වන මට්ටමට කෙටිම ශක්‍යතා කාල පරාසයක් තුල නැවත ප්‍රතිස්ථාපනය කිරීම පිණිස විද්‍යාව පදනම් කරගත් කළමණාකරන සැලසුම් ක්‍රියාත්මක කිරීම.

14.4.1 දර්ශකය- ජීව විද්‍යාත්මක තිරසාර මට්ටමකට මත්ස්‍ය තොග සමානුපාත කිරීම

ශ්‍රී ලංකාවේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ පොකිරිස්සන් (Panulirus Homarus) තොග තක්සේරු කිරීමේ ප්‍රතිඵල අනුව ඔවුන්ගේ බිජු ලෑමේ හැකියා අනුපාතයේ සමතුලිතතාව (2021 අවසානය අනුව පහත දැක්වේ)

වර්ෂය	බිජු ලෑමේ හැකියාව
2007	22% (20%-24%)
2014	18% (15%-22%)
2015	17% (15%-19%)
2017	20% (19%-21%)
2018	27% (24%-31%)
2019	21%(20%-23%)
2020	27% (23%-31%)

සාම්ප්‍රදායික යොමුගත ස්ථානය	බිජු ලෑමේ හැකියාවේ ආසන්නතාවය
පෙර සූදානම හා දිග පදනම් කර ගත් SPR	60%
පෙර සූදානම උපරිම තිරසාර ආර්ථික අස්වැන්න	50%
ඉහළ ඉලක්ක යොමුගත ස්ථානය (උපරිම තිරසාර අස්වැන්න MSY)	40%
පහළ ඉලක්ක යොමුගත ස්ථානය (උපරිම තිරසාර අස්වැන්න MSY)	30%
සීමා යොමුගත ස්ථානය (LRP)	20%

මූලාශ්‍රය - සංඛ්‍යාලේඛන අංශය ධීවර අමාත්‍යාංශය (2021)

ධීවනි ක්‍රමවේද මගින් තක්සේරු කරන ලද සමුද්‍රීය මත්ස්‍යයන්ගේ ජෛව ස්කන්ධය

වෙරළ කලාපය	වර්ෂය	කුඩා සමුද්‍ර මත්ස්‍යයන්ගේ ජෛව ස්කන්ධය PEL1 (මෙට්‍රික් ටොන්)	මධ්‍යම ප්‍රමාණයේ මත්ස්‍යයන්ගේ ජෛව ස්කන්ධයPEL2 (මෙට්‍රික් ටොන්)
ගිනිකොණ	2019	164.0	7281.0
ගිනිකොණ	2020	2240.2	2271.3

<u>තිරසාර සංවර්ධන අරමුණු ලභාකර ගැනීමට ඇති පරතර හා අභියෝග.</u>

ඉන්දියානු සාගරයේ කාර්ය බහුල මුහුදු මාර්ගවල මුහුදු ක්‍රියාකාරකම් ඉහළ යාම් වලට දිවයිනේ සාගර හා වෙරළ පද්ධති නිරාවරනය වෙමින් පවතී. මීට සමගාමීව ශ්‍රී ලංකාවේ "නීළ ආර්ථිකයක්" අත්පත් කරගැනීමේ ප්‍රයත්නය ආතතියේ බලපෑමට හසුවී ඇත. එහි ප්‍රතිඵලයක් වශයෙන් සාගර ජීව විද්‍යා තිරසාර කළමනාකරණයට බලපෑමක් විය හැකි පරතර සහ අභියෝග පැන නැගිය හැකි අතර ඉන් වඩාත්ම තීරණාත්මක ලෙස සැලකෙන දෑ පහත ලැයිස්තු ගත කොට ඇත.

හානිකර බොටම් ට්‍රෝලින් පන්න ක්‍රම යොදාගෙන ඉන්දියානු ධීවරයින් විසින් ශ්‍රී ලංකාවේ ජලතීරය තුල නීති විරෝධී මසුන් ඇල්ලීම ධීවර කර්මාන්තයේ තිරසාරභාවයට ප්‍රධාන අභියෝගයකි. මෙම තත්වය රටේ නාවුක හමුදාවට ද මැඩ පැවැත්විය නොහැකි අසීරු පරිමාණයේ ගැටළුවක් බවට වර්ධනය වී ඇත. නිති විරෝධී මසුන් මරන්නන් අඛණ්ඩව රාජ්‍ය තාන්ත්‍රික උත්සාහයන් සහ නීතිය ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේදයන් නොතකමින් කටයුතු කරයි.

නීත්‍යානුකූල නොවන, වාර්තා නොවූ, නියාමනය නොවූ ධීවර මෙහෙයුම් සිදු කිරීම මඟින් දේශීය ධීවර කර්මාන්තයට සැලකිය යුතු හානියක් සිදු කළ හැක. අනෙක් අතට සම්පත් අතින් සලකන විට එය හානිකර බලපෑමකි. එය මසුන් අපනයනය කිරීමේ කර්මාන්තයට අගතිදායක ලෙස බලපෑ හැකිය. වරක් ශ්‍රී ලංකාව නිත්‍යානුකූල නොවන, වාර්තා නොවූ හා නියාමනය නොවූ ධීවර කටයුතු සඳහා ප්‍රමාණවත් ක්‍රියාමාර්ග නොගනිමින් සහයෝගය නොදෙන පදනමින් ශ්‍රී ලංකාවේ මත්ස්‍ය අපනයනය යුරෝපා සංගමය විසින් තහනම් කරන ලදී.

ශ්‍රී ලංකාව අවට මුහුදු මාර්ග වල සාගර තදබදය වැඩි වී ඇති අතර ශ්‍රී ලංකාවේ වරායන්ට නෞකා පැමිණීමද වැඩිවෙමින් පවතී. එහි ප්‍රතිඵලයක් වශයෙන් අනාගතයේදී තෙල් කාන්දු වීම හා මුහුදු අනතුරු නිසා සාගරය දූෂණය වීමේ හැකියාව වැඩි වේ. මන්නාරම් ද්‍රෝණියේ වෙරළ ප්‍රදේශයට පිටතින් ප්‍රදේශයේ තෙල් කාන්දු වීම නිසා විධිමත් ආරක්ෂිත ක්‍රමවේද යොදා නොගත හොත් සාගර දූෂණය වැඩි විමේ අනතුරක් ඇත. ජාතික වශයෙන් ගන්නා උත්සාහයන් මගින් සාගර දූෂණය පාලනය කල නොහැකි අතර අන්තර් ජාතික දූෂණ මූලාශ්‍ර ද හැසිරවීම අපහසුය.

ආක්‍රමණික පිටස්තර ජීවී විශේෂ පැමිණීමේ තර්ජනයක් ඇතිවන අතර ජෛව ආරක්ෂණ ගැටළු ඇති කරයි.

ශ්‍රී ලංකාව විසින් වෙරළ හා සාගර සම්පත් කළමණාකරණය සඳහා සර්ව සම්පූර්ණ නෛතික ප්‍රතිපත්ති හා ආයතනික රාමුවක් සකස් කොට තිබුණ ද මෙම ප්‍රතිපත්තිමය රාමුව ක්‍රියාත්මක කිරීමේදී අකාර්යක්ෂම තත්වයන් ගණනාවක් ඇත. අවේක්ෂණ කටයුතු සිදු කිරීම වෙනුවෙන් පවතින සීමිත ධාරිතාව, නිරීක්ෂණය හා බලාත්මක කිරීම මෙම තත්වය සඳහා වගකිව යුතු ප්‍රධාන කරුණු වේ.

රජය විසින් සාගර මූලාශ්‍ර මඟින් මසුන් සැපයීම වැඩි කිරීම සඳහා සැලකිය යුතු උත්සාහයක් දරා ඇත . (ඉලක්ක 14.7) කෙසේ වුවද, පසුගිය දශක දෙක තුළ දී සිදු වූ සීඝ්‍ර නිෂ්පාදන වර්ධනයට ප්‍රධාන වශයෙන්ම අදාළ වන්නේ නවීන යාත්‍රා වෙනුවෙන් සිදු කරන ලද ආයෝජනයන්ගේ වැඩි වීම සහ වෙරළාසන්න ගැඹුරු මුහුදේ දිගු දුර මත්ස්‍ය මෙහෙයුම් සිදු කිරීමට තුඩුදෙන ආකාරයේ තාක්ෂණයයි. මේ හේතුවෙන් මසුන් ඇල්ලීමේ යෙදෙන යාත්‍රාවල ප්‍රමාණය 1980 සිට දෙගුණයක් වී ඇත. 1980 දී යාත්‍රාවලින් 60% ක් පමණම සාම්ප්‍රදායික යාත්‍රාවලින් සමන්විත විය. ඇතුළත එන්ජීම සහිත බහුදින යාත්‍රා, ඇතුළත එන්ජීම සහිත එක් දින යත්‍රා, පිටත එන්ජීම සහිත FRP යාත්‍රා වැනි පෞද්ගලික අංශයෙන් ආයෝජනය කළ යාන්ත්‍රික බෝට්ටු ප්‍රමාණය ඒකාකාර ප්‍රමාණයකින් වැඩි වී සාම්ප්‍රදායික යාත්‍රා ප්‍රමාණය ඉක්මවන ලදී. ධීවර වරාය, තොටුපළ, ගබඩා හා වෙළඳපළ පහසුකම් සඳහා රජය මඟින් සපයන ලද යටිතල පහසුකම් පෞද්ගලික අංශයේ ක්‍රියාකාරකම් සඳහා පිටිවහලක් සපයන ලදී.

අහිතකර මසුන් ඇල්ලීමේ උත්සාහයන් ආශ්‍රිතව ඇතිවන පාරිසරික හා සම්පත් කළමණාකරණ ගැටළු මැඩපවත්වා ගැනීම සඳහා බෝට්ටු ලියාපදිංචි කිරීම, බලපත්‍ර නිකුත් කිරීම, හානිකර ධීවර පන්න භාවිතය පාලනය කිරීම, දේශීය ධීවරයින් විසින් අධික ලෙස මත්ස්‍ය අස්වැන්න නෙළීම වළක්වාලීම කළමණාකරණය කිරීම සඳහා ධීවර සමිතිවල දායකත්වය ප්‍රවර්ධනය කිරීම වැනි නියාමන ක්‍රමවේද රජය විසින් ක්‍රියාත්මක කරයි. මෙම මැදිහත්වීම් ධීවර හා ජලජ සම්පත් පනතේ ප්‍රතිපාදනවලට අනුකූලව ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලබයි. මෙම ක්‍රියාමාර්ග වල අරමුණ වන්නේ අධික ලෙස අස්වැන්න නෙලීම වැලැක්වීම සඳහා නිෂ්පාදන මට්ටම් තිරසාර සීමාවන් තුළ පවත්වාගෙන යාමයි.

06. මානව සම්පත් පැතිකඩ

6.1. සේවක සංඛ්‍යා කළමනාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු**
ජ්‍යෙෂ්ඨ	13	07	06
තෘතීයික	01	0	01
ද්විතියික	16	07	09
ප්‍රාථමික	09	04	05

6.2. **ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපානු ලැබ ඇති ආකාරය.

ආයතනයේ පවත්නා මානව සම්පත් හිඟය සමස්ත කාර්යය සාධනයට අහිතකර ලෙස බලපෑම් කරනු ලබයි.සිටින කාර්ය මණ්ඩලය සහ කැබිනට් අමාත්‍යාංශයේ කාර්ය මණ්ඩලය කළමණාකරණය කර ගනිමින් කාර්යය සාධනය පවත්වාගෙන යනු ලැබේ.(රාජකාරි ආවරණය , වැඩ බැලීම, රාජකාරි ඉටු කිරීමේ පදනම් මත.)

6.3. මානව සම්පත් සංවර්ධනය

ඉහතදී කැබිනට් අමාත්‍යාංශය යටතේ පුහුණු වැඩසටහන් සංවිධානය කරන ලදි.

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩ සටහනේ කාල සීමාව	සමස්ත ආයෝජනය (Rs. '000)		වැඩසටහනෙ ස්වභාවය (දේශීය/විදේශීය)	නිමැවුම/ලබා ගත් දැනුම
			දේශීය	විදේශීය		

***ආයතනයේ කාර්ය සාධනය උදෙසා පුහුණු වැඩසටහන දායක වන්නේ කෙසේද යන්න කෙටියෙන් පැහැදිලි කරන්න.**

කාර්ය මණ්ඩලයේ ඵලදායිතාව සහ කාර්යක්ෂමතාව වැඩි දියුණු කර ඇත.

07.අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූලවේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම්	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
01	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ.**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)	අදාල නොවේ		
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්			
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්			
1.6	වෙනත්			
02	**පොත් පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ.445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2,2	පුද්ගල පඩිනඩි ලේඛණ/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2,3	විගණන විමසුම් ලේඛණය යාවත් කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත් කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ		

2.5	සියලුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ		
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		

2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GAN 20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
03	**මුල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ 135)**			
3.1	ආයතනය තුළ මුල්‍ය බලතල පවරා තිබීම	අනුකූල වේ		
3.2	මූල්‍ය බලතල පවරා තිබීම පිළිබඳව ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරාදී තිබීම	අනුකූල වේ		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරීවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ		
04	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		

4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිතදිනටඉදිරිපත්කිරීම	අනුකූල වේ		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
05	**විගණන විමසුම**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියලුම විගණන විමසුම වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූල වේ		

06	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ. (134) (2) DMA/1-2019 අනුව, වසරආරම්භයේදීවිගණකාධිපතිවරයාසමඟසාකච්ඡාකිරීමෙන්අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම.	අනුකූල වේ		
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම	අනුකූල වේ		
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
07	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA/1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	කළමනාකරණ විගණන චක්‍රලේඛ අනුව අනුකූල වේ		
08	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිල දී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොන්ට්‍රෝලර්	අනුකූල වේ		

	ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම			
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම.සම්බන්ධිකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත්කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොන්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තාකර තිබීම	අනුකූල වේ		

8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපති වරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම	අදාල නොවේ.		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදුකිරීම	අදාල නොවේ.		
09	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
9.2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම	අනුකූල වේ		
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වා ගෙන යාම.	අනුකූල වේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ 103,104,109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල වේ		
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන	අනුකූල වේ		

	තිබීම			
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අනුකූල වේ		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		

11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ		
11.2	මු.රෙ 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කල පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම් වලට එලඹීම	අනුකූල වේ		
12	**රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**	අනුකූල වේ		
12.1	සීමාවන් වලට අනුකූල වීම	අනුකූල වේ		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදුකර තිබීම	අනුකූල වේ		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදුකර තිබීම	අනුකූල වේ		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූල වේ		
13	**පොදු තැන්පත් ගිණුම**	අනුකූල වේ		
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම	අනුකූල වේ		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ		
14	**අග්‍රිම ගිණුම**	අනුකූල වේ		
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ		
14.2	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ නත්කාර්ය අතුරු අග්‍රිම එම කාර්යය	අනුකූල වේ		

	අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම			
14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ		
15	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසි වලට අනුකූලව රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම සිදු කොට තිබීම	අදාල නොවේ		
15.2	රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිනුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම	අදාල නොවේ		

15.3	මු.රෙ 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අදාල නොවේ		
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල වේ		
16.2	කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයන් වෙත රාජකාරී ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම	අනුකූල වේ		
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා /චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල වේ		
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		

18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018 (1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි /සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	අනුකූල වේ		
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි /සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	අනුකූල වේ		

19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූල වේ		
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූල වේ		
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ථ කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූල වේ		
19.4	ඉහත චක්‍රලේඛයේ (19.1 හි සඳහන්) 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩදටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත්කොට තිබීම	අනුකූල වේ		
20	**විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩු පාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ		

අවසානය.